# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/50 - 2012 ජුනි මස 01 වැනි සිකුරාදා - 2012.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදන

රේගු ආඥාපනතේ (235 අධිකාරය) 111 වගන්තිය යටතේ වන නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, රේගු ආඥාපනතේ (235 අධිකාරය) 111 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, දකුණු පළාතේ පිහිටි හම්බන්තොට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරායක් විය යුතු බව සහ එහි සීමාවන් මෙහි උපලේඛණයේ "අ" හී සඳහන් කර ඇති පරිදි විය යුතු බව මෙම නියමය මගින් නියම කර ප්‍රකාශයට පත් කරමි. තවද, උපලේඛණයේ "ආ" හී සඳහන් කර ඇති ස්ථාන එහි සඳහන් සීමාවන් තුළ, භාණ්ඩ නැව්ගත කිරීම හා ගොඩබෑම සඳහා වන නීත්‍යානුකූල ජැටියක් වියයුතු බව සහ හම්බන්තොට වරාය සීමාව තුල එම ජැටියන්හී මායිම් සහ ප්‍රමාණයන් උපලේඛණය "අ" හී සඳහන් පරිදි විය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 ජුනි මස 01 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය "අ"

***හම්බන්තොට වරායෙහි වරාය සීමාව***

ඉඩම් ප්‍රදේශය : බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමාච්චි විසින් පිළියෙල කළ අංක එස්/එම්. අයි. එස්/381 හා 2008.09.15 දාතම දරන පිඹුරුපතෙහි සවිස්තරාත්මකව සඳහන් කැබලි අංක ඒ අක්ෂරය දරන ඉඩම් කැබැල්ලට මායිම් පහත දැක්වේ :–

*උතුරට* : මහවැලි අධිකාරියේ ඉඩම (එල් 12 සිට එල් 13 වන දක්වා වන රේඛාව), පාර (මහා මාර්ගය) හා ආරබොක්ක පාර ;

*නැගෙනහිරට* : පාර (මහා මාර්ගය), ලේවායේ එගොඩහ කොටසක් (එල්15 සිට එල් 16 දක්වා වන රේඛාව), ආරබොක්ක පාර (ප්‍රාදේශීය සභා), ඇළ, ආලෝකපුර පාර, ටාගට් පාර, පාර (මහා මාර්ගය), මේජර්ස් ගාඩ්න්හී කොටස (එල් 17, එල් 18, එල් 19 සිට එල් 20 දක්වා වන රේඛාව) ;

1A - G 16202 — 360 (2012/06)

දකුණට : ඇළ, පාර (ප්‍රාදේශීය සභා), ආලෝකපුර පාර, ටාගට් පාර, වඩදිය මුහුදු මට්ටම, මිරිජ්ජවිල කැලයේ කොටසක් (එල් 2, එල් 3, එල් 4, එල් 5, එල් 6, එල් 7, එල් 8, එල් 9, එල් 10 හරහා එල් 1 සිට එල් 11 දක්වා අඳින ලද රේඛාව) සහ අඩි 100 පාර (මහා මාර්ගය) ;

බටහිරට : මිරිජ්ජවිල කැලයේ කොටසක් (එල් 2, එල් 3, එල් 4, එල් 5, එල් 6, එල් 7, එල් 8, එල් 9, එල් 10 හරහා එල් 1 සිට එල් 11 දක්වා අඳින ලද රේඛාව) සහ අඩි 100 පාර (මහා මාර්ගය), මහවැලි අධිකාරියට අයත් ඉඩම් (එල් 12, එල් 13, සිට එල් 14 දක්වා අඳින ලද රේඛාව).

උපලේඛණයේ "ආ" හම්බන්තොට වරායෙහි නම් කරන ලද නීත්‍යානුකූල ජැටියත්

| ජැටියේ නම | දිග (මීටර්) | සීමාව | දිශාව | ජාතික ජාල ඛණ්ඩාංකය | |
|---|---|---|---|---|---|
| | | | | උතුරින් | නැගෙනහිරින් |
| පොදු කාර්ය ජැටිය | 600 | උතුරු<br>දකුණු | උතුරට<br>$180^0$ | 403,510.130<br>402,910.130 | 535,797.251<br>535,797.251 |
| සේවා ජැටිය | 105 | උතුරු<br>දකුණු | උතුරට<br>$180^0$ | 402,291.130<br>402,805.130 | 535,797.251<br>535,797.251 |
| තෙල් පර්යන්තය | 310 | උතුරු<br>දකුණු | උතුරට<br>$180^0$ | 403,291.238<br>402,981.238 | 536,597.251<br>536,597.251 |
| නව තෙල් පර්යන්තය | 300 | උතුරු<br>දකුණු | උතුරට<br>$347^0$ 35’ 20” | 402,976.798<br>402,683.808 | 536,597.251<br>536,661.727 |

06-1082

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.